දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784811

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
"இசுருபாயா" ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව


ඔබේ අංකය / உமது இல. / Your No. ……………………………

මගේ අංකය / எமது இல / My No. ED/01/10/05/119 [illegible]

දිනය / திகதி 2010.04.23

චක්‍රලේඛ අංක : 2010/16

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## 2010 වර්ෂයේ සිට පාසල් වාර විභාග පාසල් මට්ටමින් පැවැත්වීම

පාසල් වාර විභාග පැවැත්වීමට අදාළව නිකුත් කරන ලද 2009/30 චක්‍රලේඛයට අනුව පාසල් වාර විභාග පැවැත්වීමට යාමේ දී මතු වූ ගැටලු සහගත තත්ත්වයන් හේතු කොට ගෙන 2010 වර්ෂයේ සිට පාසල් වාර විභාග පාසල් මට්ටමින් පැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත. එබැවින් පාසල් වාර විභාග සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2009/30 චක්‍රලේඛයේ උපදෙස් අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් බලපැවැත්වෙන හෙයින් මින් ඉදිරියට මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

02. ඒ අනුව සෑම පාසලක් විසින් ම පළමු, දෙවන, හා තෙවන පාසල් වාරයන්ට අදාලව වාර විභාග පැවැත්වීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය වන ප්‍රශ්න පත්‍ර සකස් කිරීම පාසල් මට්ටමින් සිදු කිරීම කළ යුතුව ඇති අතර එසේ සකසන ප්‍රශ්න පත්‍ර නිසි ප්‍රමිතියකින් හා ගුණාත්මක බවකින් පැවතිය යුතු හෙයින් ඒ සඳහා ක්‍රමවත් වැඩ සටහනක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු වේ.

03. එබැවින් පාසල් කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ වාර විභාග කමිටුවක් පත් කිරීමටත් එයට ඒ ඒ විෂයන් හි නිපුණතාවයන් ඇති ගුරුවරු පත් කර එමගින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමටත් කටයුතු කළ යුතු ය. මෙම ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ දී අදාළ වර්ෂය තුළ ඒ ඒ වාරය තෙක් අවසන් කළ යුතු විෂය නිර්දේශ ආවරණය වන පරිදි සකස් කිරීමටත් අවසාන වාර පරීක්ෂණයේ දී සමස්ථ විෂය නිර්දේශය ආවරණය වන පරිදි ප්‍රශ්න පත්‍ර සකස් කිරීමටත් විභාග සැකසුම් කමිටුව විසින් වග බලා ගත යුතු වේ.

04. එසේ විභාග කමිටුව විසින් සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍ර පාසල් කළමනාකරණ මණ්ඩලයේ මෙන් ම විෂය ප්‍රධානීන්ගේ ද අධීක්ෂණයට ලක්වීමෙන් අනතුරුව මුද්‍රණ කටයුතු කිරීම සිදුකළ යුතු වේ. මෙම කාර්යය සාර්ථකවත් නිවැරදිවත් ඉටු කිරීම සඳහා කල්වේලා ඇති ව වාර විභාග තුනෙහි වැඩ කටයුතු සංවිධානය කිරීම හා සැලසුම් කිරීම අත්‍යාවශ්‍ය වන හෙයින් විදුහල්පතිවරුන් විසින් ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

මෙහිදී දෙවන වාරය සඳහා වන වාර පරීක්ෂණ සෑම වසරකම ජූලි මාසයේ මැද සතියේ දී ආරම්භ කළ යුතු වන අතර තෙවන පාසල් වාරයේ අවසන් වාර පරීක්ෂණයන් සෑම වසරකම නොවැම්බර් මාසයේ දෙවන සතියේ දී ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වන අතර සෑම වාරපරීක්ෂණයක් අවසානයේදී සිසුන් ලබා ගන්නා ලකුණු එම වාරය අවසන්වීමට ප්‍රථමයෙන් සිසුන් වෙත ලබාදීමට කටයුතු කිරීම වැදගත් වන හෙයින් ඒ කෙරෙහි සෑම ගුරුවරයෙකුගේම අවධානය යොමුවීම වැදගත් බව ද අවධාරණය කරමි.

තවද අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින සිසුන් හට එම විභාගයට පෙර හුරුවීමට ඇති එකම අවස්ථාව මෙන්ම ඉදිරිපත් වන විෂය ගැටලු පිළිබඳ පුනරීක්ෂණයට හා සාකච්ඡාවලට ඇති අවසන් අවස්ථාව මෙය වන බැවින් එයට ඉඩකඩ සැලසෙන පරිදි සාමාන්‍ය පෙළ සිසුන් සඳහා වන වාර පරීක්ෂණයන් කල්වේලා ඇතිව පැවැත්වීමට කටයුතු කරන ලෙස ද දන්වමි.

05. මෙහිදී ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට අදාළ ලිපිද්‍රව්‍ය ලබා ගැනීම හා වෙනත් වියදම් හා මුද්‍රණ කටයුතු සඳහාත් යන වියදම් පියවා ගැනීම සඳහා පාසල් සංවර්ධන සමිති ගිණුම, පාසල් [illegible] ගිණුම යන ගිණුම් වලින් එකක මුදල් භාවිතා කිරීමට අනුමැතිය ලබා දෙන බව දන්වමි. කෙසේ වුවද අදාල ගිණුම්වල ප්‍රමාණවත් මුදලත් නොමැති අවස්ථාවලදී පමණක් ඒ බව සනාථ කිරීමෙන් අනතුරුව පහසුකම් හා සේවා ගාස්තු ගිණුමෙන් අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා ගැනීමට ඉඩ ලබා දෙනු ලැබේ.

06. නියමිත විෂය නිර්දේශ ආවරණය වන පරිදි ක්‍රමානුකූලව හා ප්‍රමිතියකින් යුත් ප්‍රශ්න පත්‍ර සකස් කර සිසුනට ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කරවීමට විදුහල්පතිවරුන් දැනුවත් කරලීමටත් ඒ සඳහා පළාත් , කලාප හා කොට්ඨාස මට්ටමින් අධීක්ෂණ වැඩ සටහන් පවත්වා ගෙන යාමටත් කටයුතු කරන ලෙස ද දන්වමි.

07. මෙම කාර්යයේ දී විදුහල්පති හා කළමණාකරණ මණ්ඩලයද වාර විභාග කමිටුව ද මනා වගකීමකින් යුක්තව කටයුතු කර ගුණාත්මක බවකින් යුතු ප්‍රශ්න පත්‍ර සිසුනට ලබාදීමට උපරිම දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

එම්.එම්.එන්.ඩී බණ්ඩාර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත
1. සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - කරු. මේ සම්බන්ධයෙන් ඔබ කොට්ඨාසය තුල පාසල් වාර විභාග පැවැත්වීම අධීක්ෂණය කිරීම සඳහා